# මාධ්‍ය නිවේදනය.

**සිංහල / හින්දු අලුත් අවුරුදු කාලය තුළ කොළඹ සිට ගම්බිම් බලා යන මගී ජනතාවගේ පහසුව උදෙසා විශේෂ බස් රථ සේවාවක් ක්‍රියාත්මක කිරීම හා ආසන වෙන් කරවා ගැනීම හැකියාව පිළිබඳව මගී ජනතාව දැනුවත් කිරීම.**

එළඹෙන සිංහල / හින්දු අවුරුදු කාලය තුළ කොළඹ සිට ගම්බිම් බලා යන මගී ජනතාවගේ පහසුව උදෙසා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් කොළඹ පිටකොටුව බැස්ටියන් මාවත අන්තර් පළාත් බස් පර්යන්තයේ සිට හඳුනාගත් නගර දක්වා 2021-04-09 දින සිට 2021-04-12 දක්වා විශේෂ බස් රථ සේවාවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එම බස් රථ සේවා සම්බන්ධව වැඩි විස්තර හා ආසන වෙන් කරවා ගැනීමට අවස්ථාව www.ntcbooking.lk වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ Mybus-SL ජංගම දුරකථන යෙදවුම මගින් හෝ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බැස්ටියන් මාවත කාර්යාලයට පැමිණීමෙන් සිදු කර ගැනිමට පහසුකම් සලසා ඇත.

ආසන වෙන් කර ගත හැකි මාර්ග.

01. බදුල්ල
02. මොනරාගල
03. අම්පාර
04. කතරගම
05. පස්සර
06. මඩොල්සීම
07. පානම
08. ත්‍රිකුණාමලය
09. ඇඹිලිපිටිය

ශෂී වෙල්ගම
සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව
ක්ෂණික ඇමතුම් - 1955